# 1991 අංක 01 ප්‍රඥප්තිය.

## දකුණු පළාතේ පළාත් සභාව–ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය

දකුණු පළාත් තුළ ව්‍යාපාර නාම යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යන ව්‍යාපාරික ආයතන හා තැනැත්තන් ලියාපදිංචි කිරීමට විධිවිධාන යෙදීම පිණිසත්, එසේ ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු අයකිරීම පිණිසත්, ඒ හා සම්බන්ධ වූ වෙනත් කටයුතු පිණිසත් පනවන ලද ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තිය (149 වන අධිකාරිය වූ) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනතට අනුකූල වූවකි.

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය**

1. මේ ප්‍රඥප්තිය 1991 අංක. 01..... දරණ දකුණු පළාතේ ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1991.07.01 දින සිට එය ක්‍රියාත්මක වන්නේය.

**ප්‍රඥප්තිය යටතේ පරිපාලනය**

2. (1) මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා (මෙහි මින්මතු "පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් වරයෙකු පත් කරනු ලැබිය යුතුය. මේ ප්‍රඥප්තිය යටතේ සාමාන්‍ය පරිපාලනය ඔහුට භාරවන අතර, මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන, පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන් සහ වෙනත් නිලධරයන් අවශ්‍ය සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් වරයාගේ බලතල කාර්යය හෝ කර්තව්‍ය යම් පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් හෝ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සන යටතේ ලිඛිතව බලය පවරනු ලැබූ වෙනත් යම් නිලධරයකු විසින් පාවිච්චි කරනු ලැබිය හැකිය. ඉටුකරනු ලැබිය හැකිය. සිදුකරනු ලැබිය හැකිය.

**ව්‍යාපාර නාම ලියාපදිංචිය**

3. (1) මෙහි(2)වන උප වගන්තියට යටත්වද මෙම ප්‍රඥප්තිය යටතේ ප්‍රදානය කරන ලද සහතිකය බලය යටතේද හැර මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනයේදී හෝ ඉන් පසු දකුණු පළාත තුළ ව්‍යාපාර නාමයක් යටතේ ව්‍යාපාරයක් පවත්වාගෙන නොයා යුතුය.

(2) (149 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනත යටතේ දකුණු පළාත තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයන් සඳහා දැනටමත් නිකුත් කරන ලද්දා වූ සහතික පත්‍රයන් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතික පත්‍රයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට මාස 06 ක කාලයක් සඳහා පමණක් එම සහතික පත්‍රය වලංගු වන්නේ ය.

(3) ඉහත(1)උප වගන්තියේ සඳහන් ලියාපදිංචි කිරීමේ සහතික මෙම ප්‍රඥප්තියේ දින සිට මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුකූලව නියමිත ගාස්තු ගෙවා ව්‍යාපාරික ආයතන හා තැනැත්තන් ලියාපදිංචි කරවාගෙන අදාල ලියාපදිංචි කිරීමේ සහතික පත් ලබා ගත යුතුය.

/...2

(4) දකුණු පළාතේ ව්‍යාපාරික ස්ථානයක් පිහිටා ඇත්තා වූ ද මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද වලංගු සහතිකයක් නොමැතිව ව්‍යාපාරික නාමයක් යටතේ ව්‍යාපාරය කරගෙන යන්නා වූද, යම් ව්‍යාපාරික ආයතනයක් හෝ තැනැත්තකු, මේ ප්‍රඥප්තියේ 4 වන, වගන්තිය මගින් ඒකාබද්ධ කරන ලද(149 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම ආඥාපනතේ විධිවිධාන සලස්වා ඇති දණ්ඩන වලට යටත් විය යුතුය.

**ඒකාබද්ධ කිරීමේ වගන්තිය**

4. (1) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද(149 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනතේ 2 සිට 16 දක්වා වූ වගන්තිවල (ඒ වගන්ති දෙකම ඇතුළුව)සහ 18 සිට 20 දක්වා(ඒ වගන්ති දෙකම) ඇතුළුව) වගන්තිවල විධිවිධාන එකී වගන්තිවල "ආඥා පනත" යන වචනය යෙදී ඇති කවර වුවද තැනක ඒ වෙනුවට "ප්‍රඥප්තිය"යන වචනය ආදේශ කිරීමට යටත්ව සහ එකී ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනතේ 8 වන ඡේදයේ "රුපියල් සියයකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමට යටත්ව සහ එම ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනතේ 10 වන ඡේදයේ "රුපියල් තුන්සියයකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමට යටත්ව මේ ප්‍රඥප්තියෙහි ඒකාබද්ධ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒවා මේ ප්‍රඥප්තියෙහි කොටසක් වන්නේය. කවද එකී වගන්ති අවශ්‍ය වෙනස් කිරීම් සහිතව දකුණු පළාත තුළ ව්‍යාපාර නාම යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යන ව්‍යාපාරික ආයතන හා තැනැත්තන් ලියාපදිංචි කිරීම සඳහා අදාළ වන්නේය.

(2) මෙහි 1 වන තීරයෙහි දැක්වෙන යම් නිලධරයෙකුට, ස්ථානයකට, ආයතනයකට හෝ වෙනත් දෙයකට අදාළව(1) වන උප වගන්තියේ සඳහන් විධිවිධාන වලට ඇතුලත් වන යම් සඳහනක් මෙහි 2 වන තීරයේ තදානුරූපව දක්වා ඇති නිලධරයෙකුට, ස්ථානයකට, ආයතනයකට හෝ වෙනත් දෙයකට කරනු ලැබූ සඳහනක් සේ සලකනු ලැබිය යුතුය.

| 1 වන තීරය | | 2 වන තීරය |
|---|---|---|
| අමාත්‍යවරයා | .. | දකුණු පළාතේ වෙළඳ විෂය භාර පළාත් අමාත්‍යවරයා |
| රෙජිස්ට්‍රාර් | .. | පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් |
| මේ ආඥාපනත | .. | මේ ප්‍රඥප්තිය |

**(149 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම ආඥාපනත දකුණු පළාත තුළ අදාළ නොවන බව**

5. (149 වන අධිකාරය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනතේ විධිවිධාන අදාළ වන බවට මේ ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇත්තේ යයි සලකනු ලබන තාක් දුරට හැර, එකී ආඥාපනතේ විධිවිධාන, ව්‍යාපාරික නාම යටතේ දකුණු පළාත් තුළ ව්‍යාපාර කරගෙන යන ව්‍යාපාර ආයතන සහ තැනැත්තන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් සහ ඊට සම්බන්ධ කාර්යය සම්බන්ධයෙන් ක්‍රියාත්මකවීම නතර විය යුතුය.

**නියෝග සම්පාදනය කිරීමේ බලය**

6\. (1) පහත දැක්වෙන කවර කරුණක් සඳහා වුවද ව්‍යවස්ථා හෝ නියෝග දකුණු පළාතේ වෙළඳ විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් සම්පාදනය කළ හැකිය.

(අ) පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයෙකු හා පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන් පත්කිරීම හා මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා ලියාපදිංචි කිරීමේ කාර්යාල පිහිටුවීම.

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ කිසියම් ප්‍රකාශයක් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රුපියල් පන්සියයකට වැඩි නොවන පරිද්දෙන් පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්ට හෝ පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන්ට ගෙවිය යුතු ගාස්තු

(ඇ) මෙම ප්‍රඥප්තිය යටතේ පාවිච්චි කළ යුතු ආකෘති.

(ඈ) මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් හා පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් විසින් ඉටුකළ යුතු යුතුකම්.

(ඉ) මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් විසින් කළ යුතු බවට නියම වූ කාර්යභාරය පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාරවරුන් හා සෙසු නිලධාරීන් විසින් ඉටු කිරීම.

(ඊ) මෙම ප්‍රඥප්තිය යටතේ තබනු ලබන ලේඛන හෝ ඒවායේ අන්තර්ගත විස්තර පිළිබඳ වාර්තාවන්හි විස්තර ගැසට් පත්‍රයෙන් හෝ වෙනත් ක්‍රමයකින් කලින් කළ, ප්‍රසිද්ධියට පත් කිරීම.

(උ) මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කිරීම පිළිබඳ සාමාන්‍ය පරිපාටිය හා පාලනය සහ ඊට ආගන්තුක වූ සෙසු කරුණු ද වේ.

(2) එබඳු කිසියම් ව්‍යවස්ථා හෝ ආඥා සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම ගාස්තු දකුණු පළාතේ වෙළඳ විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් විධාන කරන පරිද්දෙන් ගෙවිය යුතුය.

1991 මැයි මස 14 වන දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ බව මෙයින් සහතික කරමි.

සභාපති,
දකුණු පළාත් සභාව.

1991 මැයි මස 21 වන දින,
ගාල්ලේ,
පළාත් සභා කාර්යාලයේ දිය.